15. නිවස පිහිටි ස්ථානය :.....................................................................................................

16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :..................................................................................

17. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :

| නම | වයස | ඉගෙනුම ලබන පාසලේ නම | ඉගෙනුම ලබන පංතිය/ශ්‍රේණිය |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |

18. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිල දී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇත් ද? එසේ නම් පහත විස්තර සපයන්න :

(1) ලබා ගත් ණය මුදල :..............................................................................................................

(2) ණය ලබා ගත් ආයතනයේ/දෙපාර්තමේන්තුවේ නම :.........................................................................

(3) දැනට ගෙවීමට ඇති ශේෂය :.........................................................................................................

19. පවුලේ යම් සාමාජිකයෙකු මුදල් ඉතිරි කර තිබේ ද? තිබේ නම් පහත විස්තර සපයන්න :

| *පවුලේ සාමාජිකයාගේ නම* | *ඉතිරි කිරීමේ ගිණුම් පවත්වාගෙන යන ආයතනය* | *ඉතිරි කළ මුදල* |
|---|---|---|
| | | |
| | | |
| | | |

20. ඉඩම්ලාභියෙකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟ වන අතර, ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06ක කාල සීමාවක් තුළ ඉඩම ප්‍රමාණවත් පරිදි සංවර්ධනය කිරීමට එකඟ වෙමි. ඉදිරිපත් කරන තොරතුරු තෝරා ගැනීමෙන් පසුව වුවද අසත්‍ය බව හෙළි වුවහොත් මාගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

.......................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ඉහත අයදුම්කරු විසින් ඡේද 01 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද, එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

..........................................,
ග්‍රාම නිලධාරීගේ අත්සන.

නම :————.
ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————.
අනු අත්සන් කරමි.

............................................,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

**දිවුරුම් ප්‍රකාශය**

........................................ දිස්ත්‍රික්කයේ ........................................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ........................................ ග්‍රාම නිලධාරී වසමේ ........................................ පදිංචි ........................................ වන මම පහත සඳහන් පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මට ද, මාගේ කලත්‍රයාට ද සහ වයස අවුරුදු 18ට අඩු මාගේ දරුවන්ට ද සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම් ද ඇතුළුව) අක්කර 50කට (පනහකට) අඩුවෙන් තිබෙන සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1973 අංක 01 දරන නිවාස, දේපළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවට ද සහතික කරමි.

(2) එසේම ඉහත කී අක්කර ......................... රූඩ් ......................... පර්. ......................... ක් වූ ඉඩම් පවරා ගැනීමෙන්, මිලදී ගැනීමෙන්, පසුව වුවද ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර පනහේ (50) සීමාව නොඉක්මවන බවත් වැඩිදුරටත් මෙයින් සහතික කරමි.

...................................,
දිවුරුම්කරුගේ අත්සන.

ඉහත සඳහන් දිවුරුම්කරු/කාරියට මෙහි අඩංගු දෑ කියවා තේරුම් කර දුන් අතර ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

........................................,
සාමදාන විනිශ්චයකාර තැන.

07-696

## සබරගමුව පළාත් සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථා

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සබරගමුව පළාතේ, පළාතේ සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013.06.28 වැනි දිනැති *ගැසට් පත්‍රයේ* IV (අ) වන කොටසේ නිවේදනය කරනු ලැබූ සබරගමුව පළාතේ මහ නගර සභා බල ප්‍රදේශ තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සබරගමුව පළාතේ පළාත් සභාව විසින් 2017.09.26 වැනි දින සබරගමු පළාත් සභාවේදී කියවා සම්මත කරනු ලැබූ බව නිවේදනය කරනු ලැබේ.

ශ්‍රියානි පද්මලතා,<br>
ලේකම්,<br>
නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන,<br>
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර,<br>
වෙළෙඳ හා ආහාර, මගී ප්‍රවාහන සහ වතු සුබසාධන, පරිසර,<br>
ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් කටයුතු අමාත්‍යාංශය,<br>
සබරගමුව පළාත් සභාව.

2018 ජුනි මස 11 වැනි දින.

07-498/1

---

## සබරගමුව පළාත් සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථා

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සබරගමුව පළාතේ, පළාතේ සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013.06.28 වැනි දිනැති *ගැසට් පත්‍රයේ* IV (අ) වන කොටසේ නිවේදනය කරනු ලැබූ සබරගමුව පළාත් නගර සභා බල ප්‍රදේශ තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සබරගමුව පළාතේ පළාත් සභාව විසින් 2017.09.26 වැනි දින සබරගමු පළාත් සභාවේදී කියවා සම්මත කරනු ලැබූ බව නිවේදනය කරනු ලැබේ.

ශ්‍රියානි පද්මලතා,<br>
ලේකම්,<br>
නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන,<br>
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර,<br>
වෙළෙඳ හා ආහාර, මගී ප්‍රවාහන සහ වතු සුබසාධන, පරිසර,<br>
ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් කටයුතු අමාත්‍යාංශය,<br>
සබරගමුව පළාත් සභාව.

2018 ජුනි මස 11 වැනි දින.

07-498/2

---

## සබරගමුව පළාත් සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථා

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සබරගමුව පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013.06.28 වැනි දිනැති *ගැසට් පත්‍රයේ* IV (අ) වන කොටසේ නිවේදනය කරනු ලැබූ

සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සබරගමුව පළාතේ පළාත් සභාව විසින් 2017.09.26 වැනි දින සබරගමු පළාත් සභාවේදී කියවා සම්මත කරනු ලැබූ බව නිවේදනය කරනු ලැබේ.

ශ්‍රියානි පද්මලතා,<br>
ලේකම්,<br>
නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන,<br>
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර,<br>
වෙළෙඳ හා ආහාර, මගී ප්‍රවාහන සහ වතු සුබසාධන, පරිසර,<br>
ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් කටයුතු අමාත්‍යාංශය.<br>
සබරගමුව පළාත් සභාව.

2018 ජුනි මස 11 වැනි දින.

07-498/3

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත

### බස්නාහිර පළාත් සභා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාව යටතේ ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි ඛණ්ඩ 1 සේවා ගණයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියේ තනතුරු සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ විවෘත තරග විභාගයක්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන අතර මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *පුරප්පාඩු සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය :*

දැනට බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇති පුරප්පාඩු 5ක් සඳහා සුදුස්සන් තෝරා ගැනීමට මෙම විභාගය පවත්වනු ලබයි. දැනට පවත්නා පුරප්පාඩුවලට හෝ මතුවට ඇතිවන පුරප්පාඩු සඳහා බඳවා ගන්නා සංඛ්‍යාව පිළිබඳ අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ. තවද පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබේ.

03. *සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ.

(ii) මෙම තනතුරට බඳවාගැනීම සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයින් පත් කරනු ලබන දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව මෙම සේවයට පත් කරනු ඇත.

(iii) තනතුරට බඳවා ගැනීමෙන් පසු බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ දැක්වෙන ආකාරයට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලින් සමත් විය යුතු අතර භාෂා ප්‍රවීණතා ලබා ගත යුතු ය.

(iv) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට හා බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පරිපාටික රීති සංග්‍රහයටද, බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහයටද, බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට නොහොත් නියෝගවලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි *නොහොත්* නියෝගවලට ද, අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළ යුතු ය.

04. *වැටුප් පරිමාණය :*

අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I ට අනුව, මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 36,585 - 10x660-11x775-15x930-65,440 (MN 6-2016) වේ. නමුත් ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

05. පහත සඳහන් පරිදි පොදු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු යඃ

*(අ)* ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

*(ආ)* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් අවම වශයෙන් වසර 03ක වත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.

*(ඇ)* වයස් සීමාව වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම් උපරිම වයස් සීමාව බල නොපැවැත් වේ.)

*(ඈ)* මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය මෙම නිවේදනයේ සඳහන් සියළුම සුදුසුකම් 2018.08.17 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු අතර යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.

06. පහත සඳහන් පරිදි අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය :-

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම ;

*හෝ*

(2) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් සහිත උපාධියක් ලබා තිබීම. (මෙහිදී සම්පූර්ණ උපාධියෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතු ය ;

*සහ*

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම ;

*හෝ*

(3) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම ;

*සහ*

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම ;

*හෝ*

(4) (i) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ අවම වශයෙන් ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත (07) මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා තිබීම ;

*සහ*

(ii) අදාළ ක්ෂේත්‍රයේ වසර 02 වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

07. *විභාගය පිළිබඳ විස්තර :*

බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය ප්‍රශ්න පත්‍ර තුනකින් සමන්විත වේ. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. මෙම විභාගය තරග විභාගයක් බැවින්, පත්වීම ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන්කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතලිහක් (40%) බැගින්වත් අපේක්ෂකයන් විසින් ලබාගත යුතු අතර විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% වත් ලබා ගත යුතු වේ. සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන් ඇපැහැදිලි අත් අකුරු හා වචනවලට අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. තරග විභාගය සඳහා වෙන්කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රය* | *මුළු ලකුණු* | *කාලය* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 100 | පැය 02 යි | 40 |
| 2. අභියෝග්‍යතාව | 100 | පැය 01 යි | 40 |
| 3. සාමාන්‍ය බුද්ධිය | 100 | පැය 01 යි | 40 |

08. *විභාගය සඳහා වන විෂය නිර්දේශය :*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | විභාග අපේක්ෂකයාගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මූලධර්ම, පරිගණක නිර්මිතිය හා මෙහෙයුම් පද්ධති, මෘදුකාංග (වදන් සැකසුම, පැතුරුම්පත් ඉදිරිපත් කිරීම්, දත්ත සමුදාය කළමනාකරණය සහ කාර්යාලවල භාවිතා වන වෙනත් මෘදුකාංග පැකේජ) දෘඩාංග, දත්ත සන්නිවේදනය හා පරිගණක ජාල, අන්තර්ජාල වෙබ් අඩවි නිර්මාණය සහ නව අන්තර්ජාල සේවාවන්, ඉලෙක්ට්‍රොනික තැපෑල, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති ජීවන චක්‍රය ආදී ක්ෂේත්‍රවලින් දැනුම හා අධීක්ෂණ හැකියාව පරීක්ෂා කරනු ලබන ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. |
| 2. අභියෝග්‍යතාව | විභාග අපේක්ෂකයාගේ සංඛ්‍යා ලේඛනාත්මක හැකියාව සහ තර්කානුකූල කරුණු දැක්වීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයට අඩංගු වේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| 3. සාමාන්‍ය බුද්ධිය | සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවයන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටළු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විතවන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |

09. *විභාගය පැවැත්වීමට යෝජිත නගරය* - කොළඹ නගරය

10. *විභාග ගාස්තු :*

සෑම අපේක්ෂකයෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතු වේ. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු. 600 කි. එම විභාග ගාස්තුව, බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම, බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

11. *අයදුම්කිරීමේ ක්‍රමය :*

*(අ)* අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිතා කරමින් ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 04 තෙක් ඡේදයන් පළමු පිටුවටද, අංක 05 සිට ඉදිරියට වන ඡේදයන් අනෙකුත් පිටුවලටද, ඇතුළත් වන සේ අයදුම්පත්‍ර පිළියෙල කර ගත යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති, අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

*(ආ)* අයදුම්පත්‍ර පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, සඳහන් කළ යුතුය.

*(ඇ)* සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2018.08.17 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 109, මහ වීදිය, බත්තරමුල්ල" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2018"** යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතු ය. මෙදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පත්‍රයක් භාරගනු නොලැබේ.

*(ඈ)* නිවේදනයේ සඳහන් සුදුසුකම් සහිත බව දක්වමින්, මෙම නිවේදනයට අනුකූලව සකසා ඇති හා නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරග විභාගයට පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේ දී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

*(ඉ)* අයදුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය www.psc.wp.gov.lk මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතු ය.

*(ඊ)* අයදුම්පත්‍රයේ හා විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන් සහතික කිරීමට බලයලත් අයෙකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතු ය. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේකිරීමට බලයලත් නිලධාරියෙකු ලවා ද, අනෙකුත් අයදුම්කරුවන් අත්සන සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, (රු. 498,960.00 ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිළධාරියෙකු) බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජක කෙනෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

12. *විභාගයට ඇතුල්වීම :*

*(අ)* නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාග යට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේදීම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

*(ආ)* විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නිතීරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

13. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය.-*

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයන් විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
ii. ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක්

14. *සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම.-*

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

15. *විභාග ක්‍රමය :*

i. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත් වේ.
ii. අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතු ය.

16. මෙම විභාගයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම, තැපැල් මගින් හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවිය ඔස්සේ සිදු කරනු ඇත.

17. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් අනාවරණය වන/ නොවන අදාළ කරුණු පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

18. මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි අනුවාද අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

19. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම් පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේද පළකර ඇත.

එම්. ජී. ඒ. තිලකරත්න,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2018 ජූලි මස 12 වැනි දින,
බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක 109,
මහාවීදිය, බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II වැනි ශ්‍රේණියේ බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2018*

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

* විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ෑ

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :....................................................

....................................................
(*උදා.* : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :............................

....................................................
(*උදා.* : GUNAWARDHANA H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :....................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය ෑ

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :....................................................

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :....................................................

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :

i. සිංහලෙන්/දෙමළෙන් :....................................................

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරින් :....................................................

2.4 දුරකථන අංකය :..............................................................................

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය - (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

පුරුෂ - 0
ස්ත්‍රී - 1

3.2 අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය ෑ

කොළඹ - 1
ගම්පහ - 2
කළුතර - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :..............................................................................................................................

3.4 බස්නාහිර පළාතේ ස්ථිරව පදිංචිව සිටින කාල සීමාව :.................................................................................................

3.5 ඔබ ශ්‍රී ලංකා පුරවැසියකු වන්නේ උපතින්ද ? ලියාපදිංචියෙන්ද ? :..............................................................................

4.0 4.1 විවාහක/අවිවාහක බව - විවාහක - 2, අවිවාහක - 1 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

4.2 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

4.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

5.0 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 06 අනුව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් :

i) ………………………………………………
ii) ………………………………………………

6.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) ඔව් : ☐ නැත : ☐

"ඔව්" නම් විස්තර සඳහන් කරන්න. :...................................................................................................

7.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

i. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :.......................................................................................
ii. ලදුපත් අංකය හා දිනය :..............................................................................................
iii. ගෙවූ මුදල :...............................................................................................

| විභාග ගාස්තු ගෙවූ ලදු පත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

8.0 *අයදුම්කරුගේ සහතිකය :*

*(අ)* මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමේ සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

*(ආ)* ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, අදාළ තනතුර සඳහා පත්කරනු ලැබීමට නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බවද මම දනිමි.

*(ඇ)* තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට අනුකූලව ක්‍රියා කිරීමටත් මෙම විභාග කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයක් පිළිගැනීමට මා එකඟ වෙමි.

*(ඈ)* මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

………....…………,
අයදුම්කරුගේ අත්සන.

දිනය :……………

09. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අයදුම්පතෙහි අලවා ඇති බවත්, ඔහු/ඇය ...................................... වැනි දින මා ඉදිරිපිට දී ඔහු /ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

..........................................
අත්සන සහතික කරන නිළධාරියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :...................................................................
සහතික කරන නිළධාරියාගේ සම්පූර්ණ නම :....................................................
තනතුර :.........................................................
ලිපිනය :.........................................................

07-506

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.